# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.27 පැය 0825 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 851/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා පූගොඩ කඳවුර.**

2025.04.26 වන දින උදෑසන කාලයේ කොස්ගම පොලිස් වසමේ ආනන්දගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා පූගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මත්පෙති 80 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කොස්ගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 21 ක් වන අකරවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොස්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා වව්නියාව කඳවුර.**

2025.04.26 වන දින දහවල් කාලයේ වව්නියාව පොලිස් වසමේ අධිකරණ සංකීර්ණය ආසන්නයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා වව්නියාව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා ග්‍රෑම් 100 ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වව්නියාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 30 ක් වන නෙදුන්කේණි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වව්නියාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. වෙඩිතබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමේ අපරාධයකට අවශ්‍යාකර සිටි සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා අනුරාධපුර කඳවුර.**

2025.04.25 වන දින තඹුත්තේගම පොලිස් වසමේ යාය 03 ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර 2025.04.22 වන දින කටුනායක පොලිස් වසමේ ආඩියම්බලම ප්‍රදේශයේ නිවසකදී පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරිමට තැත් කිරීම හා 2025.02.26 වන දින මිනුවන්ගොඩ පොලිස් වසමේ පන්තඩුවන ප්‍රදේශයේදී වෙඩි තබා පුද්ගලයෙකුට තුවාල සිදු කිරීමේ අපරාධවල යතුරුපැදිකරු ලෙස කටයුතු කල සැකකරුවෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 08 ක් සමඟ ද** මෙම අපරාධවල සැකකරුවන්ට පලායාමට ප්‍රවාහන පහසුකම් සැපයූ හා ගිනි අවි ප්‍රවාහනය කල සැකකරුවෙකු **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලි ග්‍රෑම් 360 ක්** හා ත්‍රීරොද රථයක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 29 හා 42 වයස වයස්වල පසුවන මීගමුව හා කටුනායක ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සිදු කරන ලද වැඩිදුර විමශර්නයේදී ඉහත අපරාධ සඳහා ආධාර අනුබල දුන් තවත් සැකකාරියන් දෙදෙනෙකු හා සැකකරුවෙකු කටුනායක පොලිස් වසමේ

හීනටියන ප්‍රදේශයේදී හා කඹුත්තේගම පොලිස් වසමේ යාය 03 ප්‍රදේශවලදි අත්අඩංගුවට ගෙන ඇත

**සැකකරු වයස අවුරුදු 52 ක් හා සැකකාරියන් වයස අවුරුදු 50, 55 ක් වූ තඹුත්තේගම හා මිනුවන්ගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් හා සැකකාරියන් වැඩිදුර විමශර්න සඳහා කටුනායක පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. කටුනායක පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව තේක්ක දැව සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා අරන්තලාව කඳවුර.**

2025.04.26 වන දින සවස් කාලයේ මහඔය පොලිස් වසමේ ඉද්දපොල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා අරන්තලාව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව තේක්ක දැව තොගයක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහඔය අධවි වන කායර්ාලයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 57 ක් වන ඉද්දපොල, මහඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**05. නීති විරෝධී ලෙස රක්ෂිතයක් එළි පෙහෙළි කළ කල සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා අරුගම්බේ කඳවුර.**

2025.04.26 වන දින උදෑසන කාලයේ පොතුවිල් පොලිස් වසමේ සෙංගමුව රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා අරුගම්බේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස අක්කරයක පමණ කැලෑ ප්‍රදේශයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන පොතුවිල් අධවි වන කායර්ාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 47 හා 52 යන වයස්වල පසුවන පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**06. බූස්ස බන්ධනාගාරයේ සිදුකළ සෝදිසි මෙහෙයුමකදී නීති විරෝධී උපකරණ අත්අඩංගුවට ගැනීම - පොලිස් විශේෂ කායර් බලකා බූස්ස කඳවුර.**

2025.04.26 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කායර් බලකා බූස්ස කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බූස්ස බන්ධනාගාරයේ හදිසි සෝදිසි මෙහෙයුමක් සිදුකර සූක්ෂම ලෙස සඟවා තිබූ **ජංගම දූරකථන 06 ක්, චාජර් 06 ක්, ඩේටා කේබල් 15 ක්, හැන්ඩ් ෆ්‍රී 07 ක්, රවුටර් 01 ක් ඇතුළු දේපල පොලිස් භාරයට** ගෙන බන්ධනාගාර පාලනාධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**